මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PE/2024/54 — 2024.11.03

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14
## ඡන්දය ප්‍රකාශ කිරීම හා මනාප ලකුණු කිරීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීම

### ඡන්ද පත්‍රිකා ආදර්ශය (1 වන රූපය)

| | | |
|---|---|---|
| දේශපාලන පක්ෂය | * | |
| දේශපාලන පක්ෂය | * | |
| දේශපාලන පක්ෂය | * | |
| දේශපාලන පක්ෂය | * | |
| දේශපාලන පක්ෂය | * | |
| ස්වාධීන කණ්ඩායම 1 | * | |
| ස්වාධීන කණ්ඩායම 2 | * | |
| ස්වාධීන කණ්ඩායම 3 | * | |
| ස්වාධීන කණ්ඩායම 4 | * | |
| ස්වාධීන කණ්ඩායම 5 | * | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |

### ඡන්ද පත්‍රිකා ආදර්ශය (2 රූපය)

| | | | | | |
|---|---|---|---|---|---|
| දේශපාලන පක්ෂය | * | | දේශපාලන පක්ෂය | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 1 | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 2 | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 3 | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 4 | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 5 | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 6 | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 7 | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 8 | * | |
| දේශපාලන පක්ෂය | * | | ස්වාධීන කණ්ඩායම 9 | * | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |

* එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ ලකුණ

1. පොළොන්නරුව, මොණරාගල සහ කෑගල්ල මැතිවරණ කොට්ඨාසවල ඡන්ද පත්‍රිකා ඉහත 1 රූපය පරිදි එක් තීරුවකටත්; සෙසු මැතිවරණ කොට්ඨාසවල ඡන්ද පත්‍රිකා 2 රූපය පරිදි තීරු 2 කටත් මුද්‍රණය කර ඇත. එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්ද පත්‍රිකාවේ ආදර්ශය සෑම ගෘහයකටම නිල ඡන්ද දැන්වීම්පත සමඟ ලබාදෙන අපේක්ෂක ලැයිස්තුවෙහි මුද්‍රණය කර ඇත.

2. සෑම ඡන්දදායකුට ම එක් ඡන්දයක් ඇති අතර ඒ ඡන්දය පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට හෝ දෙනු ලැබිය හැකිය.

3. තම ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ නම සහ ලකුණ ඉදිරියෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ අංකය සහ ලකුණ ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ කතිර ලකුණක් (මෙසේ "X") යෙදිය යුතුය. ඊට පසුව එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් තුන් දෙනෙකුට නොවැඩි අපේක්ෂකයන් ගණනක් සඳහා ස්වකීය මනාපය පළ කිරීම සඳහා ඡන්ද පත්‍රිකාවේ අග දැක්වෙන එක් එක් අපේක්ෂකයාට වෙන් කර දී ඇති අනුක්‍රමික අංකයට අනුරූප අනුක්‍රමික අංකය ඇතුළත් කොටුව මත (මෙසේ "X") කතිර ලකුණක් යෙදීමෙන් සිදු කළ හැකිය.

4. ඡන්දදායකයා -

   I. පිළිගත් දේශපාලන පක්ෂ එකකට වැඩි ගණනකට ඡන්දය දුනහොත්; හෝ
   II. ස්වාධීන කණ්ඩායම් එකකට වැඩි ගණනකට ඡන්දය දුනහොත්; හෝ
   III. පිළිගත් දේශපාලන පක්ෂ එකක හෝ වැඩි ගණනක සහ ස්වාධීන කණ්ඩායම් එකක හෝ වැඩි ගණන සංකලනයකට ඡන්දය දුනහොත්;

   හෝ

   IV. තමා පසුව හඳුනාගනු ලැබීමට හේතුවිය හැකි යම් ලකුණක් පත්‍රිකාව මත තැබුවහොත් ඔහුගේ ඡන්ද පත්‍රිකාව බලරහිත වන අතර එය ගණන් කරනු නොලැබේ.

5. ඡන්දය දීම හා මනාප දීම සඳහා "කතිරය (X)" පමණක් භාවිතා කරන්න.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්